**මැදගම ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මැදගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු රු.30,000 ක් ගිණුම්ගතකර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ලැබිය යුතු ආදායම් ලෙස හඳුනාගත නොහැකි වූ බැවින් ගිණුම්ගත නොකළ අතර ඉදිරි වර්ෂයේ ජ'නල් සටහන් මගින් ගලපා හිඟ මුදල් අයකර ගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා සභා ලේකම් දීමනා ලෙස ගෙවා තිබුණු පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු.74,160 ක් ගිණුම්ගතකර නොතිබුණි. | ප්‍රතිපූර්ණය කරගත යුතු මුදල ගිණුම් ගත කළ යුතුවේ. | ලැබිය යුතු ලෙස හඳුනාගෙන නොතිබුණු බැවින් ගිණුම්ගත නොකළ බවත් 2019 වර්ෂයේදී ගිණුම්ගත කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) මැදගම ක්‍රීඩා පිටියේ ක්‍රීඩා මණ්ඩපයේ පඩිපෙළ ඉදිකිරීමේ වියදම රු.67,723 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | අඩුවෙන් සටහන්වීම නිවැරදි කළයුතුවේ. | 2019 වර්ෂයේදී ගිණුම්ගත කරමි. |

**1.4 <u>අනුකූල නොවීම්</u>**

**<u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්</u>**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | i. 2015 හා 2016 වර්ෂවලදී අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 35 කට අදාල ඉදිකිරීම් පරීක්ෂාකර හෝ අනුකූලතා සහතික නිකුත් කර හෝ නොතිබුණි. | ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | අදාල පුද්ගලයින් විසින් අනුකූලතා සහතික ලබා ගනිමින් පවතින අතර ලබා නොගන්නා අය පිළිබඳව විමර්ශනය කර නීත්‍යානුකූල පියවර ගනිමි. විධිමත් කරුණු සම්පූර්ණවී නොමැති සැලසුම් සඳහා සහතික නිකුත් කළ නොහැක. |
| | ii. ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ සිදුකර තිබුණු ඉදිකිරීම් 21 ක් සම්බන්ධයෙන් සැලසුම් කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර අනවසර ඉදිකිරීම් පිළිබඳව දැනුවත් කළ අතර කොටසක් අනුමැතිය ලබාගෙන ඇත. අනෙක් ඉදිකිරීම් නැවත පරීක්ෂාකර ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,915,221 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,458,867 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 215,538 | 215,538 | 128,328 | 87,210 | 215,538 | 215,538 | 157,168 | 58,370 |
| (ii) | කුලී | 600,000 | 556,120 | 556,120 | - | 500,000 | 611,720 | 611,720 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 400,000 | 349,700 | 349,700 | - | 400,000 | 342,960 | 342,960 | - |
| (iv) | වෙනත් ආදායම් | 20,876,895 | 16,858,904 | 16,512,181 | 346,723 | 17,634,351 | 15,608,556 | 15,341,273 | 267,283 |
| | එකතුව | 22,092,433 | 17,980,262 | 17,546,329 | 433,933 | 18,749,889 | 16,778,774 | 16,453,121 | 325,653 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| (i) සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති රු.133,278 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 112,123 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | විශේෂ අවධානයක් යොමුකරන ලෙස ආදායම් පරීක්ෂක දැනුවත් කර ඇති අතර ජංගම වැඩසටහනක් මගින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 215,538 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු. 87,210 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | විශේෂ අවධානයක් යොමුකරන ලෙස ආදායම් පරීක්ෂක දැනුවත් කර ඇති අතර ජංගම වැඩසටහනක් මගින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**(ආ)** <u>බදු කුලී</u>

| | | |
|---|---|---|
| සභාවට අයත් බදු දී තිබුණු දේපල 03 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ බදු කුලිය රු.173,198 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගත යුතුවේ. | 2019 අප්‍රේල් 30 දිනවන විට රු. 42,046 ක හිඟ මුදලක් අයකර ගෙන ඇත. |

### 2.2.3 <u>කඩකාමර කුලී</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලීනව බදුදී තිබුණු කඩකාමර 142ක් අවසන් වරට 2013 වර්ෂයේ තක්සේරුකර තිබුණු අතර එම තක්සේරුව මත හෝ කුලී අයනොකර 2006 වර්ෂයේ කරන ලද තක්සේරු අගයට සියයට 40ක් එකතුකර කුලී අයකර තිබුණි. 2013 වර්ෂයේ තක්සේරුව සිදුකර වර්ෂ 5 කට අධික කාලයක් ගතවී තිබුණද එම තක්සේරුව මත කුලී අය නොකිරීම නිසා රු. 9,021,484 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි. | නව තක්සේරු අනුව බදු කුලී අයකළ යුතුවේ. | කඩකාමර අලුතින් තක්සේරු කිරීමට 2019 අප්‍රේල් 22 දින තක්සේරු දෙපාර්තමේන්තුවෙන් පැමිණි අතර ඒ අනුව නව තක්සේරු ලැබුණු පසු නව තක්සේරු කුලී අයකිරීමට කටයුතු කරමි. |
| (ආ) | සභාවට අයත් දීර්ඝකාලීනව බදුදෙන ලද කඩකාමර 157 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ බදු කුලිය රු.125,611 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ කඩ කුලී අයකර ගත යුතුවේ. | 2019 අප්‍රේල් 30 දින වන විට හිඟ මුදලින් රු. 95,355 ක් අයකරගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු.1,642,210 ක් හා හිඟ මුද්දර ගාස්තු රු.1,869,372 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේදී උසාවි දඩ රු. 1,284,943 ක් සහ මුද්දර ගාස්තු රු. 1,144,309 ක් අයකරගෙන ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** <u>අතුරු ව්‍යවස්ථා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටත් ඉන් කාරණා 05ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගත යුතුවේ. | අනෙකුත් කාරණා සඳහා ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා සකස් කරමි. |

**(ආ)** <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතු වේ. | ආයතනයට අදාල වන ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ඉදිරියේදී කටයුතු කරමි. |

**3.2** <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බලප්‍රදේශය තුල පවත්වාගෙන යන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 34 ක් සඳහා අදාල කටයුතු කර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදී නොතිබුණි. | මෙම ව්‍යාපාර පරීක්ෂාකර නියමිත ගාස්තු අයකර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතුවේ. | බලපත්‍ර ලබාගත යුතු අයට ලබා ගන්නා ලෙස දැනුවත්කර ඇති අතර ලබා නොගන්නා අයට එරෙහිව නීති මගින් කටයුතු කරමි. |

**3.3** <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) <u>කාර්ය මණ්ඩලය අනුමත කර නොගැනීම</u>** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 05 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සිටි සේවකයන් 08 දෙනෙකුගේ තනතුරු අනුමත කරගෙන නොතිබුණි. | අතිරික්ත කාර්ය මණ්ඩලයේ තනතුරු අනුමත කර ගත යුතුවේ. | මාසික කාර්ය මණ්ඩල තොරතුරු වාර්තාව මගින් පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දී ඇත. |
| **(ආ) <u>කාර්ය මණ්ඩල පුරප්පාඩු</u>** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය අනුව සභාවේ තනතුරු 6 කට අදාලව පුරප්පාඩු 7 ක් පැවතුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | මාසික කාර්ය මණ්ඩල තොරතුරු වාර්තාව මගින් පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දී ඇත. |

**3.4** <u>වත්කම් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| **3.4.1** | සභාව විසින් පවත්වාගෙන යනු ලබන මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව මාර්ග 225 ක් පැවතියද, | ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු | ගැසට් මගින් ප්‍රකාශයට |

| | | |
|---|---|---|
| ඉන් මාර්ග 116 ක් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතුකර නොතිබුණි. | කළ යුතුවේ. | පත්කිරීමට කටයුතු කරමි. |

**3.4.2 පවරා නොගත් වත්කම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාවට අයත් අක්කර 32 පර්චස් 18 ක් වූ ඉඩම් කැබැලි 46 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණු අතර සභාව සතු ඉඩම් කැබැලි 42 ක මැනුම් කටයුතුකර නොතිබුණි | සභාවට අයත් ඉඩම් මැනීම් කටයුතු කර නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුවේ. | අදාල ආයතන දැනුවත් කර ඉඩම් පවරා ගැනීමටත් මැනුම් කටයුතු කිරීමටත් කටයුතු කරමි. |

**3.4.3 නිෂ්ක්‍රීය වත්කම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාවට අයත් අත් ට්‍රැක්ටරයක් සහ පස් තලන යන්ත්‍රයක් පිළිවෙලින් 2012 සහ 2017 වර්ෂවල සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි. | ප්‍රයෝජනයට ගැනීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | අලුත්වැඩියා කිරීමට මිල ගණන් කැඳවා ඇති අතර අලුත්වැඩියාවෙන් පසු භාවිතා කරමි. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ ක්‍රියාකාරකම් 18ක් ඉටු කිරීමට කටයුතුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් ඉටු කිරීමට හෝ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය හෝ කළයුතුවේ. | නිලධාරීන්ගේ හිඟය, හිඟ කුලී අයකර ගැනීමට නීති මාර්ගයෙන් කටයුතු කිරීමේ පිරිවැය වැඩිවීම, කර්මාන්ත ඉටුකිරීමට මුදල් |

| | | |
|---|---|---|
| | | ප්‍රමාණවත් නොවීම වැනි හේතු මත ක්‍රියාකාරකම් ඉටු කිරීමට නොහැකි විය. |

## 4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

### 4.1 <u>අයවැය පාලනය</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 3 ක සියයට 22 සිට සියයට 59 දක්වාද වියදම් විෂයයන් 5ක සියයට 13 සිට සියයට 219 දක්වාද විචලනයන් පැවතුණි. | නිවැරදි අයවැය ලේඛනයක් පිළියෙලකර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුවේ. | යන්ත්‍ර කුලියටදීම වෙනුවට මාර්ග නඩත්තු කිරීමට සිදුවීම, ආදායමෙන් කරන ගෙවීම් වියදම් ශීර්ෂවලට ගැලපීම වැනි හේතු මත විචලනයන් සිදුවිය. |

### 4.2 <u>අභ්‍යන්තර විගණනය</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇති බවට තොරතුරු නොමැත. |

### 4.3 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්ඒ/ 2009 (01) දරන 2009 ජුනි 9 දිනැති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සභාව තුල විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා පවත්වාගෙන යා යුතුවේ. | 2016 මාර්තු 24 දින කමිටුවක් පිහිට වූ අතර 2018 කාර්තු 2 ක රැස්වීම් පළාත් පාලන කොමසාරිස් කාර්යාලවලත් පවත්වා ඇත. |